## අමරදේව

අමරදේව ගායනානන් කලාව උදෙසා තමන්ගේ වගකීම නිසි ලෙස ඉටු කර අපෙන් සමු අරන් ගිහින්.  පත්තර රේඩියෝ රූපවාහිනී අන්ර්ජාලෙ පිරීලා තියෙන්නෙ ඔහු ගැන විස්තර වලින්. මට ලියන්න දෙයක් ඉතිරි වෙලා තියේවිද මන්දා. නොලියා ඉන්නත් ඉඳලා ආණ්ඩුවත් ඉතින් සතියක සෝක කාලයක් වෙන් කරලා තියෙන එකේ නොලියා කොහොමද?

ලියන්න පටන් ගත්ත මේ මොහොතේත් අන්තර්ජාලය හරහා නරඹන අයිටීඑන් එකේ ප්‍රචාරය වෙන්නෙ ඔහුගේ "සඳකත් පිනිදිය" පට්ටම වොයිස් එක. මොන ගීතය ගත්තත් හිත නිවෙනවා. ඒකෙ දෙකක් නැහැ. ගායන මාධූර්යය නම් කියලා නිම කරන්න බැහැ සහෝ. අපේ සංගීත ලෝකෙ වැඩ කාරයෝ බොහො මයි. එහෙත් මාස්ටර්ලා ඉන්නෙ ටිකයි. රූපසිංහ මාස්ටර් ගවුස් මාස්ටර් කේමදාස වගේ කීප දෙනෙක් තමයි ඉහලින් ඉන්නෙ. අපේ අමරදේව මාස්ටරුත් වැටෙන්නෙ ඒ ගනයටම තමයි. ඒක ලේසියෙන් ගන්න



පුලුවන් පට්ටමක් නෙවෙයි. දැන් වුණත් මාස්ටර් එකක් ගන්න පිම් කීයක් පනින්න ඕනෙද? ඒව ගන්න නම් නියම කලර්ස් පෙන්නන්න ඕනෙ. ඒ පෙන්නීමේ කොලිටිය නිසාම තමයි දශක ගණනාවක් තිස්සේ අපේ කට්ටිය එතුමාට මේ තරම් බොක්කෙන්ම ලව් කරන්නෙ.

අපේ රටේ ජනාධිපතිවරයෙගෙ කරෙන් අවසන් ගමන් ගිය කලාකාරයෙක් තවත් ඇද්ද? අවුල තියෙන්නෙ එතුමාව කට්ටිය දෙවි කෙනෙක් කරන්න යාමයි. ඔහු සැබෑ දක්ෂයෙක් ඒලෙසම ඔහු සාමාන්‍ය මනුස්සයෙක්. අනෙක් බොහෝ දෙනෙකුට සිදු වෙනවා වගේ සමාජ ජීවිත භාවිතාවෙදි ඔහුගෙන් සිදුවූ අතපසුවීම් බොහොමයි. ඒ ගැන අපේ අපේ ප්‍රවීණ කතුවරයෙක් වන දයාසිංහ ගුණසිහ මහත්තයත් ඒ දවස්වල කියලා තිබුණෝ "අමරදේවයෝ ද මැරෙති" කියලා. ඔය කතන්දර මේ වෙලාවෙ මෙතෙන්ට ගැලපුනේ නැති වුණත් හොඳ හා නරක දෙකම සමසමව හෝ  දක්ෂයන්ගේ ජීවිත වල තිබෙන බවත් අවබෝධ කරගත් යුතුයි.

ඇත්තටම අපි හැමෝටම දැන් කතා කරන්න වෙලා තියෙන්නෙ මේ ප්‍රවීණ හැම කෙනෙකුගේම අතීත භාවිතාවේ සුරු විරු කම් පමණක්නෙ. අද සිටින අපි අගය කරන කිසිම ප්‍රවීණයෙක් දශකයක පමණ කාලය තුළ සංගීතයේ ප්‍රගමණය ගැන කළ දෙයක් තියෙනවද කියලා මේ අවස්ථාවේ පොඩි ඉල්ලීමක් කරන්නත් කැමතියි.

වියෝවකින් ඇතිවන රික්තය ගැන හඬාවැළපෙන හැම කෙනෙක්ම වගේ ඒකට වගකිවයුතුයි කියලයි චූටි මල්ලිට හිතෙන්නෙ. ඒකයි මම හැම තිස්සෙ ඔහු දෙවියකු නොව දක්ෂයකු පමණක් යයි කියා කියන්න උත්සාහ කරන්නෙ.

## මෙහෙත් එහෙ වගේමයි



අපි හැමදාම දේශපාලන හා සංස්කෘතික කාරණා වලදි බටහිරට පලු යන්න බැන්නට දේශපාලකයාගෙ ඉඳලා පොඩි මිනිහා දක්වාම චාන්ස් එකක් ආවොත් පැනගන්න ට්‍රයි කරන්නෙ බටහිර රටකට මිසක් ආසියාව පැත්තට නොවන බව සහතික ඇත්ත . එහෙමෙ වුණෝ කොච්චරට බටහිරට බැන්නත් ඒ රටවල් වල දියුණුවට හේතුව උන් වෙලාවට වැඩ කරන එක. දූෂණයෙන් තොර වීම. දක්ෂයන්ට තැන දීම. අවංක බව නිසාය කියලා අපේ යටි හිත හොඳින්ම දන්න නිසානෙ. ඉතින් ඒ හේතු කාරණා හේතුකොටගෙනනෙ අපි දෙයියනේ කියලා මෙහෙට ඇවිත් රිසි සේ සම සේ හැම අයිතිවාසිකමක්ම භුක්ති විඳින්නෙ. ඒක


theguardian
politics sport football culture lifestyle environment economy med
Victorian minister sorry for 97km chauffeur-driven trip for his dogs
Corrections minister Steve Herbert's ministerial driver took Jack Russell dogs Te and Patch to Herbert's holiday house

www.theguardian.com

නිසාමනෙ දස දහස් ගණන් සංක්‍රමණිකයෝ අනේක දුක් විඳගෙන මෙහෙට එන්න ට්‍රයි කරන්නෙ. ඒ සංක්‍රමණික ප්‍රජාවගේ පැමිණීම වැඩි වෙලා මුලු ඔස්ට්‍රේලියානු සමාජ රටාවම සංකලනය වෙලා උඩු යටිකුරු වෙමින් තියෙනවද කියලා හිතෙන්නෙ දැන් දැන් රට පුරාම ලැබෙන ආරංචි වලින්. ඒව එච්චර හොඳ ඒවා නෙවෙනයි. මිනී මැරීම් දූෂණ වංචාවල් හැම එකක්ම වර්ධනය වෙලා ඇවිත් පාලන තන්ත්‍රය දක්වාම උඩු යටිකුරු වෙලා වගෙයි. මේ මිනස්සු අපේ රටෙන්වත් ආදර්ශටක් අරගෙනද මන්දා. අපේ රටේ නම් ප්‍රවණතා දෙකක් තියෙනවනෙ.

එකක් හොරකම. අනෙක ඒකෙ වගක් නැති කම. බලන්නකො අර වික්ටෝරියා මන්ත්‍රීගෙ බලු කේස් එක. මිනිහ මහජන මුදලින් ආණ්ඩුවෙ වාහන වලින් බල්ලො ඇදලා වැඩේ මාට්ටු වුණාම ගාණ ගෙවලා වලකීමෙන් නිදහස් වෙන්න හදනවා. ඒකටම හරියන්න මහඇමතියත් උන්දැට දඬුවම් දීම වෙනුවට මුදල් අයකරගෙන වැඩේ ෂේප් කරන්න ට්‍රයි කරනවා. වරද කළ මන්ත්‍රී සමාව ඉල්ලලා තියෙන නිසා වැඩේ එතනින්ම ක්ලෝස් කරන්න ඕනෙ කියලයි මහඇමතිත් කියන්නෙ.

මට මතක් වෙන්නෙම අපේ මහ බැංකු කේස් එක. ඉහළන් වැරදි කාරයෝ ආක්ෂා කරන්න ට්‍රයි කරන එක. අනෙක බැසිල්ගෙ මාලිගා කේස් එක. ගත්ත එකෙක් නෑ අයිති කාරයෙක් නෑ. බඩු රාජසන්තකයි. නඩුව ඉවරයි. මරු ක්‍රමේ නේද?

අපේ රටේ නම් ඒව එහෙම කරන්න හැකි වෙලා තියෙන්නෙ පුරවැසියාගෙ නිද්‍රාශීලී භාවය නිසයි. මේ රටේ තාම පුරවැසි සංවිධාන වලට තියෙන බලය වැඩියි. ඒ නිසා මේ වෙනුවෙන් අපි හඬක් නැගිය යුතුමයි. සංවිධානගත විය යුතුමයි. එරෙහිවිය යුතුමයි. ඒනිසා මේ රටේ සිදුවන මෙවැනි සිදුවීම් ගැන අවදියෙන් ඉන්න. කතා කරන්න. විරෝධය දක්වන්න. අපේ කාලෙ ඉවරයි. ඉස් සරහට තියෙන දරුවන්ගෙ කාලෙ ගැන හිතමු. උන්ට සාධාරණ සමාජයක් ඉතුරු කරලා යන එක අපේ වගකීම.

මොකා කළත් වරද වරදමයි.

## එක්ව මරණය වැළඳගත් විරුවන් වෙන්ව සැමරීමේ පාපය



තවත් විරු සැමරුමක් ඇවිත්. මේ සැමරුම යට කොපමණ නම් සැඟවුණ කතන්දර තියෙනවද? සැබෑ විරුවන් ලෙස මරණය වැළඳගත් දස දහස් ගණන් වූ ඒ මිනිසුන් පිළිබඳ මතකය සදා කල් අපේ හිත් හඬවනවා.

දැන් වසර කීයක් තිස්සේ මේ විරු සැමරුම් මේ විදියටම කෙරෙනවද? දැන්වීම් දෙකක් දැක්කා සමරුම් උත්සව දෙකක් ගැන. මාර දුකයි. එකට මැරිච්ච එවුන් දෙකට බෙදිලා සමරණවා. ඒහෙම වෙන්න පුලුවන්ද?

ජීවත් වෙලා ඉන්න එවුන් මැරිච්ච එවුන් සමරන්නෙ මේ දෙකන් කොයි එවුන් එක්කද?

## වෙන විරෝධයක් හොයා ගන්න සහෝ

ලංකාවෙ විශ්ව විද්‍යාලයකට ඇතුල් වෙන් ලැබෙන්නෙ කීයෙන් කිෙ දනෙකුටද යන්න අපි හැමෝම දන්නවා. ලක්ෂ ගණනක් උසස් පෙළ සමත් වෙද්දි එයින් සියයට විසි පහක් වගේ තමයි විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන්න වරම් ලබන්නෙ. ඉතිරි සියයට හැත්තෑ පහ...?

ඉතුරු සියයට හැත්තෑ පහ තමයි ඉඩකඩමක් උගස් කරලා හරි කොහොම හරි මදල් ටිකක් හොයාගෙන බාහිර උපාධි කරන්නෙ. චාටඩ් එකවුන්ටින් කරන්නෙ. IESL විභාග  කරන්නෙ. NIBM NISM විභාග කරන්නෙ. IT පාඨමාලා හදාරන්නෙ.  අද මේ පාරවල් වහලා දාන්න පෙරටුගාමීන් දරන මාරාන්ති උත්සාහය මට නම් මහම පිළිකුලක් ඇති කරන්නෙ.

අනාගතකයක් තිබිය යුත්තෙ විශ්ව විද්‍යාල වලට යන්නට හැකිවුණ ශිෂ්‍යයන්ට පමණක්ද? උසස් පෙළ සමත්වෙලා විශ්ව විද්‍යාලයට යන්න නොහැකි වුණ ශිෂ්‍යන්ගෙ ඉරණම අර විශ්ව විධ්‍යල වලට යන්න පුලුවන් වුණ අයට බැල මෙහෙවර කරන එකද?



අද ලෝකය වෙනස්වෙලා තියන එකවත් මේ සාහෝදරවරුන්ට තේරෙන්නෙ නැහැ. අධ්‍යාපනය රජය හරහාම ලබා දිය යුතුය කියන සංකල්පය අද යල් පැනලා ගිහින්. රජයේ වගකීම අධ්‍යාපනය පරිපාලන කිරීම සහා නියාමනය කිරීමය කියන එක අද පිළිගත්ත දෙයක්.

උසස්පෙළ සමත් වෙන සියල්ලන්ටම විශ්ව විද්‍යාල වරම් දෙන්න කිසිම ආණ්ඩුවකට හැකියාවක් නැහැ. එහෙම තියෙද්දි අර අසරණයන්ට ඉදිරියට යන්න තියෙන පාරවල් වහලා දාන්න පෙළපාලි යන එක හරිම කැතයි සහෝ. හයක් හතරක් නොතේරෙන විශ්ව විද්‍යාල කොලුගැටයන්ගේ මොළ වලට විෂ බීජ දාලා උන්ව පාරවල් දිගේ දක්කගෙන යන්නෙ ගමන්ගෙ පන්තියෙම එවුන්ට විරුද්ධව නේද කියන එක මොහාතකට හිතපල්ලා.

සල්ලි තියෙන ධනපතියන් නම් ඔස්ට්‍රේලියාට එංගලන්නයට ඇමරිනාවට හරි එහෙමත් නැත්නම් ඉන්දියාවට බංග්ලාදේශයට හරි කමන්ගෙ දරුවන් යවලා උගන්නාවි. ඒත් අපේ රටේ මධ්‍යම පාන්තික දෙමාපියන්ගෙ දරුවන්ට එමෙ කරන්න හයියක් කොයිද්? උන් තමයි යන්තම් සල්ලි ටිකක් හොයාගෙන විකල්ප පාඨමාලාවක් හදාරලා ඉස්සරහට යන්න උත්සාහ කරන්නෙ. උන්ට එරෙහිව තමයි සහෝදරවරු මේ පාරට බැහැලා තියෙන්නෙ.

දේශපාලන පක්ෂ වලට විශේෂයෙන්ම වාමාංශික දේශපාලන පක්ෂ වලට සිය පැවැත්ම සඳහා සටන් පාඨ අවශ්‍ය තමයි. ඒත් සහෝදරවරුණි මේ අල්ලාගෙන තියෙන සටන්පාඨය නම් අන්තිම කැත නින්දාසාහගත එකක්. සහෝරවරුන්ට හදවතක් තියෙනවා නම් වෙන සටන් පාඨයක් හොයා ගන්න.

අනුන්ගෙ ඒවා වහන්න දඟලන්නෙ නැතිව තමන් ඉගෙන ගන්න විශ්වවිද්‍යාල වල තියෙන දහසක් අඩුපාඩු නැතිකර දීපියව් කියලා සටන් කළොත් නරකද?

චූටි මල්ලි